**unit 16**

# අන්තර්ජාතික සංවිධාන

වාගීෂ්වර


අන්තර්ජාතික සංවිධාන හැඳින්වීම

එක්සත් ජාතීන්ගේ සංවිධානය

සාර්ක් සංවිධානය

අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමය

යුරෝපා සංගමය

පොදු රාජ්‍ය මණ්ඩලය

ආසියානු සංවර්ධන බැංකුව

රාජ්‍ය නොවන සංවිධාන

විදේශ ප්‍රතිපත්තිය



sureka wageeshwara

- **<u>අන්තර්ජාතික සංවිධාන හැඳින්වීම.</u>**

රාජ්‍යයන් කිහිපයක් එකඟතාවයක් (සම්මුතියක්) මගින් නිර්මාණය කරගනු ලබන සංවිධානය අන්තර් ජාතික සංවිධානයක් ලෙස සරලව නිර්වචනය කළ හැකිය. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් විවිධ ජාතීන් එකතු වී ස්වකීය අවශ්‍යතා මත නිර්මාණය කරගනු ලබන සංවිධාන අන්තර් ජාතික සංවිධාන ලෙස අර්ථනිරූපනය කළ හැකිය. <u>ජාත්‍යන්තර සම්බන්ධතා විෂය තුළ වැදගත් රැඟුම්කරුවකු ලෙස අන්තර්ජාතික සංවිධාන හඳුනාගත හැකිය</u>.

- **<u>අන්තර් ජාතික සංවිධාන වර්ගීකරණය.</u>**

නූතන ජාතික රාජ්‍යය තුළ අන්තර් ජාතික සංවිධාන ආකාර කිහිපයකට වර්ගීකරණය කර තිබේ. විශේෂයෙන් ජාත්‍යන්තර සම්බන්ධතා විෂය තුළ එවැනි වර්ගීකරණ කිහිපයකි.
ඒවා නම් ,

1. **අන්තර්ජාතික රාජ්‍ය සංවිධාන.**
2. **අන්තර්ජාතික රාජ්‍යය නොවන සංවිධාන.**

### අන්තර්ජාතික රාජ්‍යය සංවිධාන

<u>හැඳින්වීම.</u>

නූතන ජාතික රාජ්‍යයන් දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් එකතු වී නිර්මාණය කර ගත් සංවිධාන අන්තර් ජාතික රාජ්‍යය සංවිධාන ලෙස හැඳින්විය හැකිය. අන්තර්ජාතික රාජ්‍යය සංවිධාන ද නැවත කොටස්වලට වර්ගීකරණය කළ හැකිය.




### අන්තර්ජාතික රාජ්‍යය නොවන සංවිධාන

<u>හැඳින්වීම.</u>

නූතන රාජ්‍යයන් තුළ ක්‍රියාත්මක වන රාජ්‍යය සම්බන්ධයකින් තොරව පුද්ගල සම්බන්ධතා ගොඩනගා ඇති සංවිධාන අන්තර්ජාතික රාජ්‍යය නොවන සංවිධාන ලෙස හැඳින්විය හැකිය.

- <u>අන්තර්ජාතික සංවිධාන වලට අදාළ **ඉතිහාසය**</u>

මිනිසුන් සංවිධාන නිර්මාණය කර ගැනීමේ ඉතිහාසය ග්‍රීක අවධිය තෙක් දිව යන්නකි. ග්‍රීක නාගරික රාජ්‍යය ක්‍රමය තුළ මිලිටරීය අරමුණු කේන්ද්‍ර කොට ගනිමින් සංවිධාන පැවති බව ග්‍රීක පෞර රාජ්‍යය ඉතිහාසය සාක්ෂි සපයයි. නමුත් නූතන අන්තර් ජාතික රාජ්‍යය සංවිධාන නිර්මාණය වන්නේ 19 වැනි සියවසේ දීය. ඒ සඳහා කාර්මික විප්ලවය, ප්‍රංශ විප්ලවය සෘජුව හේතු වූ අතර ලෝක මහා සංග්‍රාම මගින් අන්තර්ජාතික සංවිධානවල අවශ්‍යතාවය මෙන්ම එහි ව්‍යාප්තියේ වේගසීමාවන් ද වර්ධනය කළේ ය. නූතන අවධිය තුළ බිහි වූ ප්‍රථම ජාත්‍යන්තර සංවිධානය බවට පත්වන්නේ **<u>1847 බර්ලින් ගිවිසුම යටතේ පිහිටුවන ලද ජාත්‍යන්තර තැපැල් සංගමයයි</u>**.

■ **<u>ගෝලීය මට්ටමේ අන්තර්ජාතික සංවිධාන.</u>**

## එක්සත්ජාතීන්ගේ සංවිධානය (UN)

<u>හැඳින්වීම.</u>

1939 - 1945 අතර කාලය තුළ II වන ලෝක මහා සංග්‍රාමය සිදුවිය. එය ප්‍රමාණය කළ නොහැකි තරම් මානව හා භෞතික සම්පත් ප්‍රමාණයක් ලෝකයට අහිමි කළේ ය. නැවත එවැනි ලෝක යුද්ධයක් ඇති නොවීම සඳහා කටයුතු සම්පාදනය කිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය නිර්මාණය වන්නේ ය.

<u>ආරම්භය.</u>

1945 අප්‍රේල් 25 වන දින සිට ජුනි 26 දින දක්වා අතර කාලය තුළ රාජ්‍යයන් 50 (51) ක නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් **ඇමරිකාවේ සැන්ප්‍රැන්සිස්කෝ** නගරයේ පැවති අන්තර්ජාතික සම්මේලනයේ දී එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය කෙටුම්පත් කරන ලදි. 1995 දී ලංකාව එක්සත් ජාතීන්ගේ සාමාජිකත්වය ලබා ගත්තේ ය. 2006 වන විට එහි සාමාජික රටවල් සංඛ්‍යාව 192 කි.

<u>එක්සත් ජාතීන්ගේ දිනය.</u>

ඔක්තෝම්බර් 24 එක්සත් ජාතීන්ගේ දිනය වේ. චීනය, ප්‍රංශය, සෝවියට් දේශය බ්‍රිතාන්‍යය, ඇමරිකාව යන මහා රාජ්‍යයන් මෙම ප්‍රඥප්තිය පිළිගෙන අත්සන් කළ දිනය ඊට යොදා ඇත.

<u>අරමුණු.</u>

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්ති පූර්විකාව තුළ මෙම සංවිධානය පිහිටුවීමේ අරමුණු කවරේද යන්න දක්වා තිබේ.

(a) ලෝක යුද්ධ දෙකෙන් අත්විඳි ආකාරයේ පීඩාකාරී තත්ත්වයන් නැවත ඇති නොවීමට වග බලා ගැනීම. එනම් තෙවන ලෝක යුද්ධයක් ඇති නොවීමට ක්‍රියා කිරීම. සරලව දක්වන්නේ නම් ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීම හා යුද්ධය වැලැක්වීම.

(b) මූලික මිනිස් අයිතිවාසිකම් සුරක්ෂිත කරණ සහ මනුෂ්‍යත්වයට ගරු කරන සමාජ ක්‍රමයක් ස්ථාපනය කිරීම.

(c) ගිවිසුම් හා අන්තර්ජාතික නීති යන ලිපි ලේඛන වලට අනුව ක්‍රියා කිරීමට තුඩු දෙන කොන්දේසි පිහිටුවාලීම, එම කොන්දේසි සපුරාලීම සහ ජීවන තත්ත්වයන් නගා සිටුවමින් වඩා නිදහස් පරිසරයක ක්‍රියාකිරීමට ඇති හැකියාව තහවුරු කිරීම.

(d) එකිනෙකාගේ අදහස්වලට ගරු කරමින් සාමකාමීත්වයෙන් සුහදව විසීම සඳහා ක්‍රියා කිරීම.

(e) අන්තර් ජාතික සාමය සහ ආරක්ෂාව සුරක්ෂිත කරගැනීම පිණිස සියලු බල අධිකාරීත්වය ඒකරාශී කිරීම සහ පොදු යහපත සඳහා මිස අන් කරුණක් සඳහා අවිබලය නොයෙදීමේ ප්‍රතිපත්තිය පිළිගැනීම.

(f) සියලු ජාතීන්ගේ ආර්ථික සහ සාමාජයීය සංවර්ධනය සඳහා අන්තර් ජාතික විදිවිධාන යෙදීම.

(f) සියලු ජාතීන්ගේ ආර්ථික සහ සාමාජයීය සංවර්ධනය සඳහා අන්තර් ජාතික විදිවිදාන යෙදීම.

මෙම පරිදිව එක්සත් ජතීන්ගේ සංවිධානයේ මූලික අරමුණ අන්තර්ජාතික සාමය හා සුරක්ෂිත භාවය පවත්වා ගෙන යාම වේ. <u>එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවා වසර කිහිපයක් ගතවන විට අන්තර් ජාතික සාමය යන සීමාවෙහි ඔබ්බෙහි ආර්ථික හා සමාජයීය ක්ෂේත්‍රවල වර්ධනය කෙරෙහි ද අවධානය යොමු කළේ ය</u>.

<u>පරමාර්ථය</u>

ඒ අනුව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන පරමාර්ථ කිහිපයක් හඳුනාගත හැකිය.

(a) ලොව පුරා සාමය පවත්වාගෙන යාම.
(b) ජාතීන් අතර මිත්‍ර සම්බන්ධතා වර්ධනය කිරීම.
(c) දරිද්‍රතාවයෙන් යුතු ජනතාවගේ ජීවන තත්ත්වය නගා සිටුවීම, සාගින්න, ලෙඩ රෝග, නූගත්කම පිටු දැකීම.
(d) එකිනෙකාගේ අයිතිවාසිකම් හා නන්වැදෑරුම් නිදහසට ගරු කිරීම.
(e) මෙම අරමුණු සාර්ථක කර ගැනීම සඳහා ජාතින්ට උපකාරවන සංවාද මණ්ඩපයක් සේ ක්‍රියා කිරීම.

<u>මූලධර්ම</u>

එක්සත් ජාතීන්ගේ සංගමයේ මූලධර්ම.

(a) සියලු ස්වාධිපති රාජ්‍යයන් සමාන වූ ස්වාධිපති බලයකින් යුක්තය.
(b) සියලු රාජ්‍යය පාර්ෂව ප්‍රඥප්තියේ බැදීම් ප්‍රායෝගිකත්වයට පත් කිරීම.
(c) ජාත්‍යන්තර ගැටුම් සාමකාමීව නිරාකරණය කර ගැනීම.
(d) එක් රාජ්‍යයක් අනෙක් රාජ්‍යයට එරෙහිව හමුදා බලය යෙදවීමෙන් හෝ එසේ යොදවන බවට තර්ජනය කිරීමෙන් වැලකී සිටීම.
(e) රාජ්‍යයන්ගේ දේශීය අධිකරණ බලයට මැදිහත් වීම විෂයෙහි ප්‍රඥප්තිය මගින් බලය ලබා නොදීම.

<u>ව්‍යුහය</u>

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ව්‍යුහය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම III වන පරිච්ඡේදයේ 7 වන වගන්තියේ ආයතනික ව්‍යුහය දක්වා තිබේ. එය ආයතන හය (06) කින් සමන්විත වේ.

1. මහා මණ්ඩලය
2. ආරක්ෂක මණ්ඩලය.
3. ආර්ථික හා සමාජ මණ්ඩලය.
4. භාරකාරත්ව මණ්ඩලය.
5. ජාත්‍යන්තර අධිකරණය.
6. මහා ලේකම් කාර්යාලය.

# 1. මහා මණ්ඩලය

● **හැඳින්වීම.**

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධානතම ආයතනය වන්නේ මහා මණ්ඩලයයි. එය ප්‍රධාන ආයතනය බවට පත්වීමට බලපෑ හේතු සාධක කිහිපයකි.

(i) සමස්ථ ලෝක ප්‍රජාවම නියෝජනය කරන එකම ලෝක වේදිකාව මහා මණ්ඩලය වීම. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම් එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ආයතන අතුරින් සම්පූර්ණ සාමාජිකත්වය නියෝජනය කරනු ලබන ආයතනය මහා මණ්ඩලය වේ.

(ii) මහා මණ්ඩල න්‍යාය පත්‍රය තුළ පුළුල් ප්‍රමාණයෙන් පොදු හා විශේෂ ජාත්‍යන්තර ප්‍රශ්න පිළිබඳ සාකච්ඡා කිරීම.

(iii) සංවිධානයේ සෙසු ආයතන සම්බන්ධීකරණ කාර්යයන් හා අධීක්ෂණ කාර්යයන් එය සතු වීම.

(iv) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන සංවාද මණ්ඩපය මෙය වේ. එක් සාමාජිකයකට හිමි වන්නේ එක් ඡන්දයකි.

● **සාමාජිකත්වය.**

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලබා ඇති සියලු රාජ්‍යයන්ට මහා මණ්ඩලයේ සාමාජිකත්වය හිමි වේ. ඒ අනුව වර්තමානය තුළ සාමාජික රාජ්‍යයන් ප්‍රමාණය (2006 - 192) කි. එක් සාමාජික රාජ්‍යයකට එක් ඡන්දයක් පමණක් හිමි වේ. සාමාන්‍ය බහුතර ඡන්දයෙන් (1/2) ක් සම්මුතින්ට එලඹේ. නමුත් ජාත්‍යන්තර වැදගත් ප්‍රශ්න වලදී (2/3) විශේෂ බහුතරයෙන් තීරණ ගනී.

● **සංයුතිය.**

සංයුතිය සම්බන්ධයෙන් 9 වැනි වගන්තියේ දැක්වේ. එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් සාමාජිකත්වය ලබාගෙන ඇති සියලු රාජ්‍යයන්ට මහා මණ්ඩලයේ සමාජිකත්වය හිමි වේ. සංවිධානය තුළ සෑම රාජ්‍යයක් වෙනුවෙන්ම නියෝජිතයින් පස් (5) දෙනෙකුට වැඩි ප්‍රමාණයක් නොසිටිය යුතු ය. ආරම්භය තුළ සාමාජික රටවල් සංඛ්‍යාව 51 කි. 2006 වන විට එය 192 ක් දක්වා වර්ධනය වී තිබේ.

● **රැස්වීම.**

මහා මණ්ඩලය දෙවැදෑරුම් ආකාරයකට සැසිවාර පවත්වයි. වාර්ෂික සැසිවාර, විශේෂ සැසිවාර ලෙස එය හඳුනාගත හැකිය. 1950 වන විට නව සැසිවාරයක් එකතු වී තිබේ. හදිසි විශේෂ සැසිවාරය ලෙස එය හැඳින්විය හැකිය. නිව්යෝර්ක් හි එක්සත් ජාතීන්ගේ මූලස්ථානය ස්ථාපනය කර අවස්ථාවේ සිට මෙම සැසිවාර තුනම පවත්වනු ලබන්නේ නිව්යෝර්ක් නුවරදී ය.

I. <u>වාර්ෂික සැසිවාරය</u>

සියලුම සාමජික රටවල සහභාගීත්වයෙන් පවත් වනු ලබන වාර්ෂික සැසිවාරය පවත්වනු ලබන්නේ සැප්තැම්බර් මාසයේ තුන්වැනි අඟහරුවාදා දිනකදී ය. **කිසියම් හෙතුවක් මත නිව්යෝර්ක් වල සමුළු වාරය නොපවත්වන්නේ නම් දින 120 ට පෙර ඒ බව සාමාජිකයන්ට දැනුම් දිය යුතු ය.**

II. <u>විශේෂ සැසිවාර</u>

විශේෂිත ප්‍රශ්නයක් සම්බන්ධයෙන් මහා මණ්ඩලයේ අවධානය යොමු කළ යුතු යැයි මහා මණ්ඩලයේම බහුතරයක් විසින් හෝ ආරක්ෂ මණ්ඩලයේ බහුතරය මහ ලේකම්වරයාගෙන් ඉල්ලා සිටි විට විශේෂ සැසිවාරය කැඳවිය යුතු ය. **විශේෂ සැසිවාර කැඳවීමේ දී දින 30 ට පෙර දැනුම් දිය යුතු ය.**

III. <u>හදිසි විශේෂ සැසිවාර</u>

හදිසි විශේෂ සැසිවාර කැඳවීමේ ක්‍රමය එක්සත් ජාතීන්ගේ සංවිධානය ආරම්භ වී ක්‍රියාත්මක වීමේ දී 1950 දී පමණ ඇතිවූවකි. එවැනි තත්ත්වයක් තුළ පැය 24 ක් තුළ හදිසි විශේස සැසිවාර කැඳවිය හැකි ය.

- <u>කාර්ය හා බලතල.</u>

**1. නිරායුධකරණය, අවි සීමා කිරීම ඇතුළු අන්තර් ජාතික සහයෝගී තාවය පිළිබඳ ප්‍රතිපත්ති සලකා බැලීම හා ප්‍රශ්න සාකච්ඡා කිරීම.**

**2. ආරක්ෂක මණ්ඩලය තුළ සාකච්ඡා නොවූ අන්තර් ජාතික සාමය සහ සුරක්ෂිතභාවට අදාළ ඕනෑම ප්‍රශ්නයක් සාකච්ඡා කිරීම සහ එය නිරාකරණය කිරීම සඳහා නිර්දේශ නිකුත් කිරීම.**

**3. අන්තර් ජාතික දේශපාලන සහයෝගීතාවය, ජාත්‍යන්තර නීතිය, මානව හිමිකම් හා මූලික නිදහස, අන්තර්ජාතික ආර්ථික, සමාජ, සංස්කෘතික හා සෞඛ්‍යය ක්ෂේත්‍රවල සහයෝගීතාවය වර්ධනය කිරීම.**

**4. අන්තර් ජාතික ගැටුම් හා අර්බුධ සාමකාමීව නිරාකරණය කර ගැනීමට නිර්දේශ නිකුත් කිරීම.**

**5. අයවැය අනුමත කිරීම සහ සාමාජිකයන්ට ගෙවිය යුතු අරමුදල් අනුමත කිරීම.**

**6. ඇතැම් පත් කිරීම් සිදු කිරීම.**

**(උදා -: ආරක්ෂක මණ්ඩලයට ස්ථිර නොවන සාමාජිකයින් පත් කිරීම, ආර්ථික හා සමාජ මණ්ඩලයේ සාමාජිකයින් පත් කිරීම, භාරකාර මණ්ඩලය සාමාජිකයින් පත් කිරීම , ජාත්‍යන්තර අධිකරණයේ විනිසුරුවන් පත් කිරීම, ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශ මත මහ ලේකම් පත් කිරීම.)**

- මහා මණ්ඩලයේ කාර්ය හා බලතල ක්‍රියාවට නැංවීම සඳහා <u>කමිටු හයක් (6) ක්</u> පිහිටුවා තිබේ.

I. නිරායුධ කරණය, අන්තර්ජාතික ආරක්ෂාව හා දේශපාලන කටයුතු පිළිබඳ කමිටුව.
II. ආර්ථික හා මූල්‍යය කමිටුව.
III. සාමාජීය , මානුෂවාදී හා සංස්කෘතික විෂයයන් සම්බන්ධ කමිටුව.
IV. නිර්යටත් විජිත කමිටුව.
V. පරිපාලන හා අයවැය විෂයයන් සම්බන්ධ කමිටුව.
VI. නෛතික විෂයන් සම්බන්ධ කමිටුව.

මෙම සෑම කමිටුවකටම සභාපතිවරයකු හා උපසභාපති වරයෙක් සිටිති. මෙම කමිටුවල සාමාජිකත්වය සෑම සාමාජික රාජ්‍යයකටම ලබාගත හැකිය.

## 2. <u>ආරක්ෂක මණ්ඩලය</u>

● <u>හැඳින්වීම.</u>

එක්සත්ජාතීන්ගේ සංවිධානයේ විශිෂ්ඨතම හා අග්‍රගන්‍යයම ආයතනය වශයෙන් සලකනු ලබන්නේ ආරක්ෂ මණ්ඩලයයි. ලෝක සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීමේ මූලික කාර්යභාරය ඉටු කරනු ලබන්නේ මෙම මණ්ඩලය විසිනි.

● <u>සාමාජිකත්වය.</u>

දෙවන ලෝක මහා සංග්‍රාමය අවසන් කිරීමට උර දුන් මහා බලවතුන් පස් (5) දෙනා වන **ඇමරිකාව - සෝවියට් දේශය - බ්‍රිතාන්‍යය - චීනය - ප්‍රංශයට** එහි <u>නිත්‍ය සාමාජිකත්වය</u> හිමි විය. තවදුරටත් වසර දෙකක (2) නිලකාලයකට නිත්‍ය නොවන සාමාජිකයින් 10 ක් ද තෝරාපත් කර ගනී. සෑම සාමාජිකයකුටම එක් ඡන්දයක් හිමි වේ.

● <u>සංයුතිය.</u>

ආරක්ෂක මණ්ඩලයේ වර්තමාන සාමාජික සංඛ්‍යාව 15 කි. නිත්‍ය සාමාජික රාජ්‍යයන් (5) ක් හා නිත්‍ය නොව සාමාජිකයන් 10 දෙනෙකු ගෙන් එය සමන්විත වන්නේ ය.

● <u>රැස්වීම හා තීරණ ගැනීම.</u>

එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවා පළමු වසර 3 තුළ සභාවාර 130 ට ආසන්න සංඛ්‍යාවක් පවත්වා තිබුණි. <u>**සාමාන්‍ය කරුණු සම්බන්ධයෙන් සාමාජිකයින් 9 ක ගේ අනුමැතිය මත තීරණ ගත හැකිය. නමුත් වැදගත් කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීමේ දී නිත්‍ය සාමාජිකයින් 5 දෙනාගේ අනුමැතිය හා තවත් සාමාජික 9 දෙනෙකුගේ ස්ථිර කිරීම අවශ්‍ය වේ.**</u> එක් එක් සාමාජිකයකු හෝ එය යෝජනාවට විරුද්ධව ඡන්දය පාවිච්චි කළ හොත් එම යෝජනාව සම්මත වන්නේ නැත. එය <u>නිශේධ බලය</u> ලෙස හඳුන්වයි. නිශේෂ බලය නිත්‍ය සාමාජික රාජ්‍යයන්ට පමණක් ලබා දී තිබේ. ඡන්දය දීමෙන් වැලකී සිටීම නිශේධ බලය භාවිතා කිරීමක් නොවේ. එක් සාමාජිකයෙකුට එක් ඡන්දයක් පමණක් හිමි වේ.

● <u>කාර්ය හා බලතල</u>

1. අන්තර් ජාතික සාමය සුරක්ෂිත කිරීම.

2. අන්තර් ජාතික ගැටුම් වලට තුඩුදිය හැකි ආරවුල් නිරාකරණය කිරීම.

3. එවැනි ආරවුල් නිරාකරණය කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ නිකුත් කිරීම.

4. අවි ආයුධ පාලනය කිරීම සඳහා අවශ්‍ය සැලසුම් සැකසීම හා ක්‍රියාත්මක කිරීම.

5. ආක්‍රමණිකායට එරෙහිව හමුදා මිලිටරීය බලය යෙදවීම.

6. අභිනව සාමාජිකයින් ඇතුළත් කර ගැනීම නිර්දේශ කිරීම.

7. අන්තර් ජාතික සාමායට හා සුරක්ෂිතතාවයට හානිවිය හැකි ආක්‍රමණ තිබෙනවා ද යන්න තීරණය කිරීම සහ නිරාකරණයට පියවර ගැනීම.

8. උත්ගත වූ ප්‍රශ්න නිරාකරණය කිරීම සඳහා බලය යෙදවීම හැර අනෙක් පියවරයන් වන ආර්ථික සම්බාධක පැනවීම තීරණය කිරීම.

9. මහ ලේකම්වරයා සහ අන්තර් ජාතික අධිකරණ විනිසුරුවන් පත් කිරීම.

ආරක්ෂක මණ්ඩලය ස්ථාපනය කර තිබෙන්නේ ස්ථාවර පදනමක් මත අඛණ්ඩව ක්‍රියාත්මක වන ආකාරයෙනි. අවශ්‍යතාවය මත මූලස්ථනයෙන් පිටතදී වුවද ආරක්ෂක මණ්ඩල රැස්වීම පැවැත්විය හැකි.

## 3. <u>ආර්ථික හා සමාජ මණ්ඩලය</u>

● <u>හැඳින්වීම.</u>

එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ ආර්ථික හා සමාජ මණ්ඩලය ආර්ථික වර්ධනය හා සුබසාධනය සම්බන්දෙයන් ක්‍රියාත්මක වන ප්‍රධානතම ආයතනය වේ.

● <u>සාමාජිකත්වය.</u>

ආරම්භක අවස්ථාවේ දී මෙහි සාමාජිකත සංඛ්‍යාව 18 කි. වර්තමානය තුළ සාමාජික සංඛ්‍යාව 54 කි. මෙම මණ්ඩලයේ සාමාජිකයකුගේ නිලකාලය වසර 3 කි. සෑම වසරකටම වරක් සාමාජිකයන් 18 ක් ඉවත් වන අතර නව සාමාජිකයින් 18 ක් ඒ සඳහා තෝරා ගනී. සාමාජිකයකුට හිමිවන්නේ එක් ඡන්දයක් පමණි.

● කාර්ය හා බලතල.

1. අන්තර්ජාතික වශයෙන් වැදගත් කමක් ඇති ආර්ථික හා සාමාජීය විෂයන් සාකච්ඡා කිරීම.

2. මානව අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම.

3. තමන් සතු අංශවලට අදාළ අන්තර්ජාතික සමුළු පැවැත්වීම.

4. එක්සත් ජාතීන්ගේ විශේෂ ආයතන සමග ගිවිසුම් පිළියෙල කිරීම.

5. මණ්ඩලයට අදාළ කරුණු සම්බන්ධයෙන් රාජ්‍යය නොවන සංවිධානවල කරුණු විමසීම.

□ සමාජ හා ආර්ථික මණ්ඩලයේ නියෝජ්‍යය ආයතන.

| | |
|---|---|
| ලෝක කම්කරු සංවිධානය. | (ILO) |
| ආහාර හා කෘෂිකර්ම සංවිධානය | (FAO) |
| ලෝක බැංකුව | (IBRD) |
| ලෝක වෙළඳ සංවිධානය | (WTO) |
| ජාත්‍යන්තර පාසල් සංගමය | (UPU) |

## 4. භාරකාර මණ්ඩලය

● හැඳින්වීම.

II වන ලෝක යුද්ධයෙන් පසුව පරාජිත ජාතීන් සතු වූ භූම ප්‍රදේශවල ස්වයං පාලනය ඇතිකරන තෙක් පාලනය කිරීමේ බලය මහා බලවතුන්ට ලබා දුන් අතර ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට භාරකාර මණ්ඩලය පිහිටුවීය.

● සාමාජිකත්වය හා සංයුතිය.

භාරකාර මණ්ඩලයේ සාමාජිකත්වය හා සංයුතිය තරමක් දුරට සංකීර්ණ ස්වභාවයක් දරයි. ආරම්භක අවස්ථාවේ දී එහි සිටි සාමාජිකයන් උපරිම ප්‍රමාණය 14 කි. භාරකාර ප්‍රදේශවල සවයං පාලනය ලබාදෙන විට එහි සාමාජිකත්වය ද ක්‍රමයෙන් අඩු විය.

● කාර්ය හා බලතල.

1. භාරකාර ප්‍රදේශවල ආර්ථික, සමාජ, දේශපාලන හා අධ්‍යාපන ප්‍රගතිය ඇති කිරීම.

2. භාරකාර ප්‍රදේශ වලින් ලැබෙන පෙත්සම් විභාග කිරීම.

3. භාරකාර ප්‍රදේශවල ධූත මෙහෙවර සංවිධානය කිරීම.

## 5. ජාත්‍යන්තර අධිකරණය

● **හැඳින්වීම.**

ජාත්‍යන්තර තලය තුළ සිදුවන සියලුම ආකාරයේ නෛතික ආරවුල් විසඳීම සම්බන්ධයෙන් එයට බලය තිබේ. ප්‍රායෝගික භාවිතය තුළ ජාත්‍යන්තර අධිකරණය ඉදිරියට ඉදිරපත් කරන පැමිණිලි ප්‍රමාණය ඉතා අවම වේ. ඊට හේතු වන්නේ ජාත්‍යන්තර අධිකරණයේ තීරණ පිළිගැනීමට ජාතික රාජ්‍යයන් දක්වන අකමැත්තයි.

● **සාමාජිකත්වය හා සංයුතිය.**

විනිසුරුවන් 15 දෙනෙකුගෙන් මෙය සමන්විව වන්නේ ය. ආරක්ෂක මණ්ඩලය හා මහා මණ්ඩලයෙන් වෙන වෙනම ඡන්ද ප්‍රකාශ කරමින් මෙම විනිසුරුවන් තෝරා ගනී. නිලකාලය වසර 9 කි. වසර 3 ට වරක් මණ්ඩලයෙන් 1/3 ක් ඉවත් වේ. ඒ සඳහා අලුතින් 1/3 ක් තෝරාපත් කර ගනී.

● **කාර්ය හා බලතල.**

1. **ඉදිරිපත් වන නඩු විසඳීම.**

2. **ආරක්ෂක මණ්ඩලයට අදාළ නීති උපදෙස් දීම.**

3. **එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ ඇති අනෙක් ආයතන වලට නීති උපදෙස් ලබා දීම.**

4. **ප්‍රඥප්ති නිර්මාණය කිරීමේ දී ඇතිවන ගැටලු වලට අදාළ විසඳුම් නිර්මාණය කිරීම.**

## 6. මහා ලේකම් කාර්යාලය.

● **හැඳින්වීම.**

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන පරිපාලන ආයතනය වන්නේ මහා ලේකම් කාර්යාලයයි. මෙහි ප්‍රධාන පරිපාලන නිලධාරියා **මහලේකම්ය.**

● **සාමාජිකත්වය හා සංයුතිය.**

මෙහි ප්‍රධාන පරිපාලකයා **මහ ලේකම්වරයාය.** ඔහු පත් කරනු ලබන්නේ ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශ සහිතව මහා මණ්ඩලයේ 2/3 ක අනුමැතිය තුළිනි. මහ ලේකම් කාර්ය මණ්ඩලය පත් කරනු ලබන්නේ මහ ලේකම්වරයා විසිනි. **නිලකාලය වසර 5 කි.**

● <u>මහ ලේකම්වරයාගේ කාර්ය හා බලතල.</u>

1. ප්‍රධාන පරිපාලන නිලධාරියා ලෙස කටයුතු කිරීම.

2. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සියළු ප්‍රධාන ආයතන වල ලේකම්වරයා ලෙස කටයුතු කිරීම.

3. මහා මණ්ඩලය හා සෙසු මණ්ඩල විසින් පවරනු ලබන වෙනත් ඕනෑම කාර්යයක් සිදු කිරීම.

4. සංවිධානයේ කටයුතු පිළිබඳ වාර්ථාවක් ඉදිරිපත් කිරීම.

5. ජාත්‍යන්තර සාකච්ඡා , සම්මේලන ඇති කිරීම.

6. අන්තර් ජාතික ප්‍රජාවේ නියෝජිතයා ලෙස ද කටයුතු කිරීම.

7. අන්තර් ජාතික සාමයට හා ආරක්ෂාවට තර්ජනයක් වන බවට පෙනී යන කරුණක් වේ නම් ඒ සම්බන්ධයෙන් ආරක්ෂක මණ්ඩලයේ අවධානය යොමු කිරීම.

□ <u>එක්සත් ජාතීන්ගේ සංවිධානය ඉටු කරන පුළුල් කාර්ය භාරය ක්ෂේත්‍ර 05 ක් යටතේ බෙදා දැක්විය හැකිය</u>.

1. ජාත්‍යන්තර සාමය හා ආරක්ෂාව සඳහා වූ කටයුතු.
2. ආර්ථික හා සමාජ සංවර්ධනය උදෙසා වූ කටයුතු.
3. මිනිස් අයිතිවාසිකම් උදෙසා වූ කටයුතු.
4. යටත් විජිත වාදය පිටුදැකීම සඳහා වූ කටයුතු.
5. ජාත්‍යන්තර නීතිය සඳහා වූ කටයුතු.

□ <u>එක්සත් ජාතීන්ගේ සංවිධානය හා අනුබද්ධිත ආයතන.</u>

එක්සත් ජාතීන්ගේ පද්ධතිය (The United Nations System) එක්සත් ජාතීන්ගේ ලේකම් කාර්යාලය, එක්සත් ජාතීන්ගේ වැඩසටහන් සහ අරමුදල් හා විශේෂිත ආයතන එක්වීමෙන් නිර්මාණය වී ඇත.

<u>එක්සත් ජාතීන්ගේ ලේකම් කාර්යාලය.</u>

අභ්‍යන්තර ප්‍රමාද දෝෂ සේවා කාර්යාලය ( OIOS)
නීති කටයුතු කාර්යාලය (OLA)
දේශපාලන කටයුතු දෙපාර්තමේන්තුව (DPA)
නිරායුධකරණ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව (DDA)
සාම සාධක මෙහෙයුම් දෙපාර්තමේන්තුව (DPKO)
මානුෂවාදී කටයුතු සම්බන්ධීකරණ කාර්යාලය (OCHA)
ආර්ථික හා සමාජයීය කටයුතු දෙපාර්තමේන්තුව (DESA)
මහා මණ්ඩල සමුළු කළමණාකරණ දෙපාර්තමේන්තුව (DGACM)
පොදු තොරතුරු දෙපාර්තමේන්තුව (DPI)
කළමණාකාරණ දෙපාර්තමේන්තුව (DM)

- <u>එක්සත් ජාතීන්ගේ සංවිධානය හා ශ්‍රී ලංකාව</u>.

එක්සත් ජාතීන් සහ එහි එහි අනුබද්ධ ආයතන කිසියම් රාජ්‍යයක් තුළ ක්‍රියාත්මක වන්නේ එම ආණ්ඩුවේ සහ ජාතික ආයතන වල ප්‍රතිපත්ති සමඟ අනුකූල වෙමිනි. 1955 දෙසාමැබ්ර් 14 වැනි දා ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය ලැබූ අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාව ස්වාධීනවූත් නිදහස්වූත් ජාතියක් වශයෙන් ජාත්‍යන්තර පිළිගැනීමට ලක් විය. එපමණක් නොව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විවිධ ආධාර සහ අනිකුත් විශේෂඥ සේවාවන් ද ලංකාවට හිමි විය.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශේෂඥ නියොජිත ආයතන වන ජාත්‍යන්තර කම්කරු සංවිධානය, එක්සත් ජාතන්ගේ අධ්‍යාපනික , විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය, ජාත්‍යන්තර ගුවන් සොවා සංවිධානය, ලෝක සෞඛ්‍යය සංවිධානය හා සමඟ ශ්‍රී ලංකාව විසින් 1954 දෙසැමැබ්ර් 16 වන දින ගිවිසුමක් අත්සන් කරන ලදි. (1954 අංක 07 දරණ ගිවිසුම් මාලාව) එම ගිවිසුම් මූලික පරමාර්ථය වනුයේ ලංකාවේ ආර්ථික සහ සමාජයීය ප්‍රගතිය ප්‍රවර්ධනය කිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සහාය ලබා දීමයි. මෙම ගිවිසුම යටතේ එකඟ වූ ක්‍රියාකාරකම් පිළිබඳ වැඩසටහන් සංවිධානය කිරීම සහ එහි අනුමැතියට යටත්ව ලංකා ආණ්ඩුවට සහයෝගය දිය යුතු විය. ඒ යටතේ ලංකාවට පහත සඳහන් ආකාරයේ කාර්මික ආධාර හිමි විය.

01. රජයට ආධාර සහ උපදෙස් දීම සඳහා විශේෂඥ සේවාවාන්ගේ සහාය ලබා දීම.

02. තෝරාගනු ලැබූ ප්‍රදේශවල සම්මන්ත්‍රණ, පුහුණු කිරීමේ වැඩසටහන්, ප්‍රදර්ශන වැඩසටහන් හා ඒ සඳහා අවශ්‍ය පූර්ව කෘත්‍යයන් සංවිධානය කිරීම.

03. ශිෂ්‍යත්ව හා අධි ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.

04. තෝරාගනු ලැබූ ප්‍රදේශවල නියමු යෝජනා ක්‍රම, පරීක්‍ෂණ, අත්හදා බැලීම් සහ පර්යේෂණ ආරම්භ කිරීම.

05. රජයේ සහ එක්සත් ජාතීන්ගේ අන්‍යෝන්‍ය එකඟතාවය යටතේ කාර්මික ආධාර සැපයීම.

මෙයින් පසු ලංකාවට එක්සත් ජාතීන්ගේ කාර්මික ආධාර වලට අමතරව විශේෂඥ දැනුම යනාදිය හිමිකර ගැනීමේ අවස්ථාව ද උදා විය.

අද වන විට එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ සංවිධාන සහ ආයතන 19 ක් පමණ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වෙමින් පවතී. සමහර අනුබද්ධ ආයතන සහ සංවිධාන (යුනෙස්කෝව වැනි) සතුව නේවාසික කාර්යාල ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කර නොමැති වුවද, ආණ්ඩුවේ ආයතන හරහා හෝ එක්සත් ජාතීන්ගේ සංවර්ධන ආයතන මාර්ගයෙන් ඒවායේ වැඩසටහන් ක්‍රියාත්මක වේ.

■ **<u>කලාපීය මට්ටමේ අන්තර්ජාතික සංවිධාන.</u>**

## සාර්ක් සංවිධානය (SAARC)

<u>හැඳින්වීම.</u>

දකුණු ආසියානු භූගෝලීය කලාපය අධිකාරී ක්ෂේත්‍රය කොටගෙන උත්පාද වූ කලාපීය සංවිධානය 'සාර්ක් **SAARC**' සංවිධානය යනුවෙන් හැඳින් වේ. '**සාර්ක්**' යන සංගමය වාක් සංකේතය ඉංග්‍රීසි භාෂාවෙන් සකස් වූ අන්වර්ථ නාමයකි. **South Asian Association For Regional Co - operation** යන පදයේ කෙටි නාමය ' SAARC' (සාර්) යනුවෙන් හැඳින්වේ. මෙය කලාපීය ජාත්‍යන්තර සංවිධානයකි.

<u>ආරම්භය.</u>

දකුණු ආසියානු කලාපීය සහයෝගීතාවය වර්ධනය කිරීමේ අරමුණින් කලාපීය සංවිධානයක් ලෙස ස්ථාපනය කළ යුතු බව **බංග්ලාදේශ ජනාධිපති <u>සියා - උර් - රහමන්</u>** මූලික විය. ඒ අනුව 1985 දෙසැම්බර් මස 08 දින බංග්ලාදේශයේ ඩකා අගනුවරදී පැවැත්වූ රාජ්‍යය නායක සමුළුවේ දී සාර්ක් සංවිධානයේ ප්‍රඥප්ති සම්මත කොට ගෙන තිබේ. එම සමුළුවය සහභාගී වූ රාජ්‍යයන් සහ රාජ්‍යය නායකයින්,

| | | |
|---|---|---|
| බංග්ලාදේශය | - | හුසේන් මොහොමඩ් |
| මාලදිවයින | - | යවුම් අබ්දුල් ගයූම් |
| භූතානය | - | ජින්ග් වේ සින්ග් |
| නේපාලය | - | බිරේන්ද්‍ර බීර් |
| ඉන්දියාව | - | රජීව් ගාන්ධි |
| පකිස්ථානය | - | මෙහොමඩ් සියා උල්හක් |
| ශ්‍රී ලංකාව | - | ජූනියාස් රිචඩ් ජයවර්ධන |

ඒ අනුව සාර්ක් සංවිධානයේ සාමාජික රාජ්‍යයන් සංඛ්‍යාව 8 කි.

<u>අරමුණු.</u>

සාර්ක් සංවිධානවේ <u>ප්‍රධාන අරමුණු</u> පිළිබඳව සාර්ක් ප්‍රඥප්තියේ I වගන්තියේ සඳහන් වේ. තවදුරටත් <u>සාමාන්‍යය අරමුණු</u> සාර්ක් පූර්විකාවේ දැක්වේ.

### <u>ප්‍රධාන අරමුණු.</u>

(a) **දකුණු ආසියාතික රටවල ජනතාවගේ ශුභ සිද්ධිය හා ජීවන තත්ත්වය නංවාලීම.**

(b) **කලාපය තුළ ආර්ථික, සාමාජික සහ සංස්කෘතික සංවර්ධනය වේගවත් කිරීම.**

(c) **පුද්ගලයන්ගේ පෞරුෂත්වය රැකෙන අයුරින් ජීවත් වීමට අවස්ථා සැලසීම.**

(d) දකුණු ආසියාතික රටවල් අතර සාමූහික ආත්ම විශ්වාසය ප්‍රවර්ධනය කිරීම හා ශක්තිමත් කිරීම.

(e) අන්‍යොන්‍යය විශ්වාසය ඇති කිරීම, එකිනකාගේ ප්‍රශ්න නිවැරදිව අගය කිරීම හා තේරුම් ගැනීමට දායක වීම.

(f) ආර්ථික, සමාජ, සංස්කෘතික, තාක්‍ෂණික හා විද්‍යාත්මක ක්ෂේත්‍රයන්හි අන්‍යොන්‍යය උපකාරය හා සහයෝගීතාවය වර්ධනය කිරීම.

(g) සංවර්ධනය වෙමින් පවත්නා සෙසු රටවල් සමඟ සහයෝගීතාවය වර්ධනය කිරීම.

(h) සමාන අපේක්‍ෂා සහ අරමුණු සහිතව ජාත්‍යන්තර හා කලාපීය සංවිධාන සමග සහයෝගීව කටයුතු කිරීම.

(i) පොදු ප්‍රශ්න සම්බන්ධයෙන් ජාත්‍යන්තර වේදිකාවන්හිදී ඔවුනොවුන් අතර සහයෝගීතාවය වර්ධනය කර ගැනීම.

<u>සාමාන්‍ය අරමුණු.</u>

(a) කලාපය තුළ සාමය ස්ථාවරත්වය, මිත්‍රත්වය හා සංවර්ධනය වැඩි දියුණු කිරීම.

(b) යහපත් අසල්වැසියන් වශයෙන් අර්ථවත් සහයෝගීතාවයක් ගොඩනැන්වීම.

(c) දේශපාලන හා ආර්ථික ක්‍රමයන් තුළ සහයෝගීතාවය වැඩි දියුණු කරන අන්දමේ ඒකාබද්ධ ක්‍රියාමාර්ග ගැනීම.

(d) ආයතනික ව්‍යූහයක් තුළින් සහයෝගීතාවය වර්ධනය කිරීමේ අධිශ්ඨානය තහවුරු කර ගැනීම.

<u>මූලධර්ම.</u>

<u>සාමාන්‍යය මූලධර්ම.</u>

(a) සාමාජික රටවල ස්වාධිපත්‍යය, සමානතාව, දේශීය මධ්‍යස්ථතාවය, දේශපාලන නිදහස, සෙසු රාජයන්හි අභ්‍යන්තර කටයුතු වලට ඇගිලි නොගැසීම හා අන්‍යොන්‍යය යහපත උදෙසා ගරු කරමින් සම්බන්ධතා ව්‍යූහය තුල සහයෝගීතාවය ක්‍රියාත්මක කළ යුතු ය.

(b) එම සහයෝගීතාවය දැනට පවත්නා ද්විපාර්ෂවික හා බහුපාර්ශවික සබඳතාවන්ට ආශිංෂනයක් විනා ආදේශකයක් නොවිය යුතු ය.

(c) එවැනි සහයෝගීතාවයක් ද්විපාර්ෂවික හා බහු පාර්ෂවික යුතුකම් වලට නොගැලපෙන්නක් නොවිය යුතු ය.

## <u>අතිරේක මූලධර්ම.</u>

(a) **සියලුම මට්ටමේ තීරණ ගැනීම් ඒකමතිකත්වය පදනම් කරගෙන සිදුවිය යුතු ය.**

(b) **ද්විපාර්ශවික මතභේදයන්ට තුඩු දෙන්නා වූ සියලුම ප්‍රශ්න සාකච්ඡා වලින් බැහැර කළ යුත්තේ ය.**

(c) **රාජ්‍ය නායක සමුළුවට සහභාගී විය යුත්තේ එක් එක් රාජ්‍යයේ රාජ්‍යය නායකයා ය.**

<u>ව්‍යූහය.</u>

සාර්ක් සංවිධානයේ ව්‍යූහය පිළිබඳ සාර්ක් ප්‍රඥප්තියේ **ආරම්භක වගන්තියේ** 8 වන **උපවගන්තියේ** සටහන් කර තිබේ. ඒ අනුව සංවිධාන යාන්ත්‍රණය කාටස් 03 කින් සමන්විත වේ.

1. සාර්ක් සම්මේලනය
2. ලේකම් කාර්යාලය
3. වෙනත් කමිටු

### 1. <u>සාර්ක් සම්මේලනය.</u>

සාර්ක් සංවිධානයේ ප්‍රධාන පරිපාලන ඒකකය සාර්ක් සම්මේලනයයි. රාජ්‍යය නායකයින්ගේ සමුළුව ලෙස ද එය හඳුන්වයි. සාර්ක් සම්මේලනය වාර්ෂිකව පවත්වයි. නමුත් අවශ්‍යතාවය මත ඊට පෙර වුවද පැවැත්විය හැකිය. සාර්ක් සම්මේලනයේ සහභාගීත්වය දරණු ලබන්නේ සම්මේලනය පවත්වනු ලබන රටේ රාජ්‍යය නායකයාය.

### 2. <u>ලේකම් කාර්යාලය.</u>

සාර්ක් සංවිධානයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා ලේකම් කාර්යාලයක් තිබේ. ලේකම් මණ්ඩලයේ ප්‍රධානියා **මහ ලේකම්වරයා** පත්කරනු ලබන්නේ වර්ෂ දෙකකට වරක් ය. **<u>මහ ලේකම් වරයාට සහාය වීමට 8 දෙනෙකුගෙන් සමන්විත අධ්‍යක්ෂක මණ්ඩලයක් තිබේ.</u>** එම අධ්‍යක්ෂකවරු සාමජික රටවලින් එක්අයෙක් බැගින් තෝරා ගනී.

### 3. <u>වෙනත් කමිටු.</u>

| | | |
|---|---|---|
| රාජ්‍ය ලෙකම් වරුන්ගේ කමිටුව | -: | මෙය ස්ථාවර කමිටුව ලෙස ද හඳුන්වයි. සාමාජික රටවල විදේශ ලෙකම් වරුන්ගෙන් මෙය සමන්විත වේ. |
| අමාත්‍ය මණ්ඩල කමිටුව | -: | මෙය සමන්විත වන්නේ එක් එක් රාජ්‍යයන්හි විදේශ අමාත්‍යවරුන්ගෙනි. |
| තාක්ෂණික කමිටුව | -: | සාමාජික රයවල විවිධ තාක්ෂණික ක්ෂේත්‍ර නියෝජනය කරන සාමාජිකයන්ගෙන් සමන්විත වන්නේ ය. |

| | | |
|---|---|---|
| ක්‍රියාකාරී කමිටු | -: | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ස්ථාවර කමිටුව විසින් පත් කරනු ලබන නිලධාරීන්ගෙන් යුක්තය. |
| මහලේකම් කාර්යාලය | -: | මහලේකම් වරයෙකු යටතේ ක්‍රියාත්මක වේ. ඔහු පත් කිරීම සම්බන්ධයෙන් විධා විධාන කිසිවක් එහි සඳහන් නොවේ. |

□ <u>සාර්ක් ගිවිසුම.</u>

දකුණු ආසියානු කලාපයට බලපාන පොදු ප්‍රශ්න පහක් (5) ක් අල්ලා සහයෝගීතාවය පළකිරීම සඳහා **<u>සාර්ක් රටවල් අත්සන් කරනු ලැබූ ගිවිසුම් (එකඟතා) පහ මෙසේ ය.</u>**

1. සාර්ක් ආරක්ෂක ආහාර සංචිත ගිවිසුම.
2. ත්‍රස්තවාදය මර්ධනය කිරීම පිණිස කලාපීය ගිවිසුම.
3. මත්ද්‍රව්‍ය හා මනෝවෛකල්‍යක ද්‍රව්‍ය පිළිබඳ සාර්ක් ප්‍රඥප්තිය.
4. සාර්ක් වරණාත්මක වෙළෙඳ ගිවිසුම.

□ <u>සාර්ක් සංවිධානය දුර්වල වීමට බලපෑ හේතු.</u>

1. සාමාජික රාජ්‍යයන් අතර ඇති ගැටුම්. (උදා -: ඉන්දියාන / පකිස්තානය)
2. අද්දැකීම් අඩුභාවය.
3. ආර්ථික දුබලතා. (මෙම රාජ්‍යයන් 8 තෙවන ලෝකයේ රාජ්‍යයන් වීම)
4. ආයතනික දුර්වලතා.

## අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමය.
## Association of South East Asian Nations

<u>හැඳින්වීම.</u>

අග්නිදිග ආසියානු කලාපයේ රටවල් වල සාමාජිකත්වයෙන් නිර්මාණය වූ කලාපීය සංවිධානය <u>අග්නිදිග ආසියානු ජාතීන්ගේ සංගමය ලෙස හඳුන්වයි.</u> ඊට අදාළ ඉංග්‍රීසි නාමකරණ වන්නේ **Association of South East Asian Nations** ය. එම නාමරකණය සංක්ෂිප්ත කොට <u>**ASEAN** (ආසියාන්) සංගමය ලෙස ද නාමකරණය කරයි.</u> <u>ආසියාන් ( **ASEAN**) කලාපීය මට්ටමින් ක්‍රියාත්මක වන ජාත්‍යන්තර සංවිධානයකි</u>.

<u>ආරම්භය.</u>

1967 දී තායිලන්තයේ බැංකොක් නුවරදී ආරම්භ විය. <u>චීනයේ අභියෝගයට මුහුණදීම සඳහා මෙම සංවිධානය ආරම්භ විය</u>. නමුත් චීනය හා ඇමරිකාව අතර සම්බන්ධතා සම්බන්ධතා වර්ධනය වීමත් සමඟ එම තත්ත්වයන් වෙනස් විය. මෙම ආසියාන් සංගමයේ ඇතැම් සාමාජික රාජ්‍යයන් ව්‍යාඝ්‍ර පොතකයන් (**Tiger Cubs**) ලෙස ද හඳුන්වයි. මෙම සාමාජික රටවල් ලබාගෙන ඇති ආර්ථික සංවර්ධනය නිසා වඩාත් ප්‍රබල කලාපීය සංවිධානයක් ලෙස හඳුනාගෙන තිබේ.

<u>සාමාජිකත්වය.</u>

ආරම්භක අවස්ථාවේ සමාජික රටවල් 05 ක් පමණක් පැවතුනි. වර්තමානය තුළ සාමාජික රාජ්‍යයන් සංඛ්‍යා 10 කි. අග්නිදිග ආසියානු කලායේ පවතින සෑම රටක්ම එහි සාමාජිකත්වය ලබාගෙන තිබීම සුවිශේෂී ලක්ෂණයකි.

| | | |
|---|---|---|
| **මුල් සාමාජික රාජ්‍යයන් පහ** | -: | මැලේසියාව , ඉන්දුනීසියාව , තායිලන්තය , සිංගප්පූරුව , පිලිපීනය |
| **පසුව සාමාජිකත්වය ලබාගත් රාජ්‍යයන් පහ** | -: | බෘෲනි රාජ්‍යය , වියට්නාමය, ලාඕසය , බුරුමය , කාම්බෝජය |

<u>අරමුණු.</u>

(a) සාමූහික ප්‍රයත්නයන් තුළින් කලාපයේ ආර්ථික, සමාජ ප්‍රගතිය හා සංස්කෘතික වර්ධනය වේගවත් කිරීම.

(b) පොදු උනන්දුවක් ඇති ආර්ථික, සමාජ, සංස්කෘතික, තාක්ෂණික, විද්‍යාත්මක හා පරිපාලන ක්ෂේත්‍රයන්හි දී ක්‍රියාත්මක සහයෝගීතාවය හා අන්‍යොන්‍යය උපකාරව වර්ධනය කිරීම.

(c) **අධ්‍යාපනික, වෘත්තීමය, තාක්ෂණික හා පරිපාලන අංශයන්හි පුහුණුව හා පර්යේෂණ කටයුතු වලදී එකිනෙකට සහයෝගය ලබා දීම.**

(d) **කලාපය තුළ සාමය හා ස්ථාවරත්වය ප්‍රවර්ධනය කිරීම.**

මෙවැනි අරමුණු සාධනය කරගැනීමේ ද එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට හා ජාත්‍යන්තර නීතියට අනුව සමානාත්මතා මූලධර්මය මත පදනම් වී කටයුතු කළ යුතු බව පිළිගනී.

<u>මූලධර්ම</u>

(a) **ආසියානු ප්‍රශ්නවලදී ද්විපාර්ශවික ප්‍රශ්න පිළිබඳ සාකච්ඡා නොකළ යුතු ය.**

(b) **සාමාජික රටවල් අතර ඇතිවන ද්විපාර්ශවික අරගලවලට අනිකුත් සාමාජික රටවල් මැදහත් නොවිය යුතු ය.**

(c) **විවිධ අවස්ථාවලදී ගනු ලබන තීරණ වලින් ආසියාන් සාමාජික රටවල් බැදී සිටිය යුතු ය.**

(d) **ඒකමතිකව ඇති කරන ගනු ලබන තීරණ වලින් සියලුම සාමාජික රටවල් බැදී සිටීම අනිවාර්ය වේ.**

<u>ව්‍යුහය.</u>

ආසියානු ජාතීන්ගේ සංගමය 1967 බැංකොක් නුවරදී ආරම්භ විය. ආරම්භක අවස්ථාව තුළ ප්‍රබල සංවිධාන ව්‍යුහයක් ඒ තුළ දක්නට තිබුණේ නැත. එය කුඩාවූත් , සරලවූත් සංවිධානයක් ලෙස නිර්මාණය විය. නමුත් වර්තමානය තුළ ඉතා ප්‍රබල පරිපාලන ව්‍යුහයක් සහිත සංවිධානයක් බවට පත්ව තිබේ.

■ <u>ආරම්භක අවස්ථාවේ දී බිහි වූ ආයතනික ව්‍යුහය.</u>

1. විදේශ අමාත්‍ය මණ්ඩලය.
2. ආසියාන් ස්ථාවර කමිටුව.
3. ආසියාන් ජාතික මහලේකම් කාර්යාලය.
4. මහලේකම් කාර්යාලය.
5. තත්කාර්ය කමිටු.

■ <u>ආසියානු ජාතීන්ගේ සංගමය හා ශ්‍රී ලංකාව.</u>

1970 දශකයේ අවසානයේ ඉන්දීය සාගර සාම කලාප යෝජනාවට සහය ලබාගැනීමටත්, අපනයන සඳහා හොඳ මිලක් ලබා ගැනීම සඳහාත් ශ්‍රී ලංකාව එහි සාමාජිකත්වය ඉල්ලා සිටිය ද සාමාජිකත්වය හිමි වූයේ නැත. ඊට ප්‍රධාන හේතුව වූයේ අදාළ භූගෝලීය කලාපයේ රාජ්‍යයක් නොවීමයි.

## යුරෝපා සංගමය
## European Union

**<u>හැඳින්වීම.</u>**

යුරෝපා සංගමය යනු වර්තමාන ලෝකයේ පවතින ප්‍රධානතම කලාපීය සංවිධානයකි. මෙය <u>යුරෝපා පොදු ආර්ථික හවුල</u> ලෙස ද හඳුන්වයි. ඊට අදාළ ඉංග්‍රීසි නාමකරණය වන්නේ **European Economic Community** ය.

**<u>ආරම්භය.</u>**

1952 පිහිට වූ යුරෝපා ගල් අඟුරු හා වානේ කොමිසම.
1957 ඇති කළ රෝම ගිවිසුම සහ සංවිධාන එකතු කර 1957 මාර්තු 25 දින **යුරෝපා ආර්ථික ප්‍රජාව පිහිටුවීය.**

**මෙහි මූලස්ථානය බෙල්ජියමේ බ්‍රසල් නුවර පිහිටා තිබේ.**

**<u>සාමාජිකත්වය</u>.**

සාමාජික රටවල් හයකින් (6) ආරම්භ වූ මෙම සංවිධානය තුළ වර්තමානය තුළ සාමාජික රටවල් 15 කි. එවා නම්,

| | | |
|---|---|---|
| ආරම්භක සාමාජික රාජ්‍යයන් 06 | -: | බෙල්ජියම - ප්‍රංශය - ඉතාලිය - ලක්සම්බර්ග් - නෙදර්ලන්තය - බටහිර ජර්මනිය |
| පසුව එකතු වූ රාජ්‍යයන් 09 | -: | ඔස්ට්‍රියාව - බ්‍රිතාන්‍යය - ඩෙන්මාර්කය - පින්ලන්තය - ග්‍රීසිය - අයර්ලන්තය - පෘතුගාලය - ස්වීඩනය - ස්පාඤ්ඤය. |

**<u>අරමුණු.</u>**

යුරෝපා සංගමයේ අරමුණු ප්‍රධාන ශීර්ෂ දෙකක් යටතේ වර්ග කළ හැකිය.

I. ආර්ථික සහයෝගීතාවය
II. දේශපාලන සහයෝගීතාවය.

(a) **සාමජික රටවල් අතර පොදු වෙළෙඳ පොලක් ඇති කිරීම.**

(b) **සාමාජික රටවල් අතර සමතුළිත සංවර්ධනයක් ඇති කිරීම.**

(c) **ගිවිසුම් ප්‍රකාරව වසර 10 ක් තුළ සාමාජික රටවල් අතර ආනයන අපනයන තීරු බදු අවලංගු කිරීම.**

(d) **වෙළෙඳ පොල කටයුතු වලදී සාමාජික රටවල් එකම ආර්ථිකයක් ලෙස ක්‍රියා කිරීම.**

(e) **සාමාජික රටවල ගෙවුම් ශේෂ දුශ්කරතා මග හරවා ගැනීම සඳහා ආධාර කිරීම.**

<u>ව්‍යූහය.</u>

යුරෝපා සංගමයේ ආයතනික ව්‍යූහය ප්‍රධාන මණ්ඩල 09 කින් යුක්ත වේ.

1. යුරෝපා ආර්ථික කොමිසම.
2. යුරෝපා අධිකරණය.
3. යුරෝපා පාර්ලිමේන්තුව.
4. අමාත්‍යවරුන්ගේ කවුන්සිලය.

□ **<u>යුරෝපා සංගමය හා ශ්‍රී ලංකාව.</u>**

යටත් විජිත යුගයේ සිට ශ්‍රී ලංකාව ආර්ථික වශයෙන් බොහෝ දුරට සම්බන්ධ වී සිටියේ බ්‍රිතාන්‍යය සමඟ වුවද බ්‍රිතාන්‍යය යුරෝපා හවුලේ සාමාජිකත්වය ගැනීමෙන් පසු අන්‍ය යුරෝපා රටවල් සමඟ ද ආර්ථික සම්බන්ධතා දියුණු කර ගැනමට සිදු විය. ඒ මත ශ්‍රී ලංකාව යුරෝපා හවුල සමඟ පවතින සම්බන්ධතාවයන්ගේ කිහිපයක් පහත දැක්වේ.

- සාම්ප්‍රදායික අපනයන ද්‍රව්‍යයන්ට අමකරව නිමි ඇඳුම් වැනි භාණ්ඩ යුරෝපා හවුල විසින් මිළ දී ගැනීම.

- ශ්‍රී ලංකාවේ සංවර්ධන කටයුතු සඳහා ආධාර සැපයීම.

නිදසුන් : මහවැලි ප්‍රදේශයේ ජල මාර්ග සහ ජනාවාස කටයුතු සංවර්ධනයට ආධාර කිරීම.

- 1975 ඇතිකරගත් ගිවිසුමක් මත ලාංකීය අපනයනවලට සහන සලසා දීම. (මෙය සෑම වසරකම අලුත් කෙරේ)

- ඩෙන්මාර්කයේ සහ බටහිර ජර්මනියේ වෙළෙඳ මධ්‍යස්ථාන දෙකක් පිහිටුවීම.

# බ්‍රිතාන්‍ය පොදු රාජ්‍යය මණ්ඩලය.

## ආරම්භය.

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයට කාලයක් තිස්සේ යටත්ව පැවති රටවල් බ්‍රිතාන්‍යයෙන් නිදහස් වූ පසු තවදුරටත් එම රටවල් සමඟ සම්බන්ධතා පවත්වාගෙන යාමේ අදහසක් දෙවන ලෝක යුද්ධ කාලයේදීම බ්‍රිතාන්‍ය තුළ පැවතුණි. ඒ මත 1944 දී බ්‍රිතාන්‍යය, කැනඩාව, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, ඉන්දියාව, රොඩේෂියාව හා දකුණු අප්‍රිකාව යන රටවල් එක්ව මෙය පිහිටුවා ගන්නා ලදී.

## අරමුණු.

1. ආර්ථික දේශපාලන සහ සංස්කෘතික ක්ෂේත්‍රයන්ගේ අන්‍යෝන්‍ය සහයෝගීතාවය වර්ධනය කිරීම.
2. තාක්ෂණික දැනුම හුවමාරු කර ගැනීම.
3. ශිෂ්‍යත්ව හුවමාරු කර ගැනීම.
4. සාමාජික රටවල් අතර වෙළඳ ගනුදෙනු වර්ධනය කිරීම.

## සාමාජිකත්වය.

බ්‍රිතාන්‍ය යටත් විජිතයක් වශයෙන් පැවති නිදහස් වූ රටවලට මෙහි සාමාජිකත්වය ලබා ගත හැක. එහෙත් එසේ නිදහස ලබාගත් සියලු රාජ්‍යයන් එහි සාමාජිකත්වය ලබා නැත. එසේම ඕනෑම රාජ්‍යයකට සාමාජිකත්වයෙන් ඉවත් වීමට ද පුළුවන. අදවන විට මෙහි සාමාජික සංඛ්‍යාව 48 කි.

## ■ ව්‍යුහය හා සංවිධාන යාන්ත්‍රණය.

මෙය ආයතන 03 කින් සමන්විත වේ.

I. රාජ්‍ය නායක සමුළුව - සාමාජික රටවල රාජ්‍ය නායකයින් මෙයට අයත්වන අතර වසර 02 ට වරක් රැස්වේ.

II. අමාත්‍යය මට්ටමේ සහ රාජ්‍ය නිළධාරී මට්ටමේ රැස්වීම් - රාජ්‍ය නායක තීරණ ක්‍රියාත්මක කිරීමට වසරකට වරක් රැස්වේ.

III. ලේකම් කාර්යාලය.

## ■ පොදු රාජ්‍යය මණ්ඩලය හා ශ්‍රී ලංකාව.

නිදහස දිනා ගැනීමත් සමග ශ්‍රී ලංකාව මෙහි සාමාජිකත්වය ගෙන ඇති අතර, අද දක්වාත් පවතී. මෙම පොදු රාජ්‍ය මණ්ඩලයේ සෑම රැස්වීමකටම ශ්‍රී ලංකාව සහභාගී වී ඇත. ශ්‍රී ලංකාවේ විවිධ සංවර්ධන වැඩපිළිවෙලවල් සඳහා මෙහි ආධාර ලබා දී ඇත.

නිදසුන් ලෙස,

1. බල ශක්ති ව්‍යාපෘති සඳහා.
2. වන සම්පත් සංවර්ධන ව්‍යාපෘති සඳහා
3. කාර්මික සංවර්ධනය සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම.
4. ශිෂ්‍යත්ව ආධාර ලබා දීම.

## ආසියානු සංවර්ධන බැංකුව
## Asian Development Bank

<u>ආරම්භය.</u>

ආසියානු සහ ඈත පෙරදිග කලාපයට අයත් රටවල් බොහෝමයක් සංවර්ධනය වෙමින් පවතින රටවල් වන අතර, ඔවුන් මුහුණපාන ප්‍රධානට ගැටුළුව වන්නේ ප්‍රාග්ධන හිඟකම සහ තාක්ෂණික හා ශිල්පීය දැනුමේ හිඟකමයි. මෙම ගැටළුවලට විසඳුම් සෙවීමට 1963 දී ආසියාවේ සහ ඈත පෙරදිග රටවල මුදල් අමාත්‍යවරුන්ගේ සමුළුවේ දී සාකච්ඡාකාරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස 1965 දෙසැම්බර් මස ආසියානු සංවර්ධන බැංකුව පිහිටුව ලදි. එහි නිල ආරම්භය ලෙස සැලකෙන්නේ 1966 දෙසැම්බර් 19 දිනය.

<u>අරමුණු.</u>

1. කලාපයේ සංවර්ධනයෙන් අඩු රටවලට ආර්ථික සංවර්ධනය සඳහා මූල්‍ය පහසුකම් සැලසීම.

2. සාමාජික රටවල සංවර්ධන සැලසුම් අතර සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම.

3. අවශ්‍ය තාක්ෂණික ආධාර සැපයීම.

<u>සාමාජිකත්වය.</u>

දැනට මෙම සාමාජිකත්වය රටවල් 48 හිමි වී ඇත. එයින් 32 ක් ආසියානු හා පැසිපික් කලාපීය රටවල් වේ. 15 ක් යුරෝපීය හා ඇමෙරිකානු රටවල් ය. මේ නිසා මෙහි සාමාජිකත්වය ආසියාතික රටවලින් ඔබ්බට ද ගොස් ඇත.

<u>සංවිධාන යාන්ත්‍රණය.</u>

1. මෙය අධිපති මණ්ඩලයකින්, අධ්‍යක්‍ෂ මණ්ඩලයකින් සහ සභාපතිවරයෙකුගෙන් සමන්විත වේ.

2. අධිපති මණ්ඩලය සාමාජික රටවලින් පවත්වන ප්‍රධාන අධිපතිවරුන් හා අතිරේක අධිපතිවරුන්ගෙන් සමන්විත වේ. යෙ අවුරුද්දකට වරක් රැස්වෙන අතර සැසිවාර සඳහා මුදල් ඇමතිවරුන්, නියෝජ්‍ය මුදල් ඇමතිවරුන් සහ මහ බැංකු පාලකයෝ සහභාගි වෙති. ඡන්ද බලය සාමාජික රටවල දායකත්වයට අනුපාතිකව හිමිවේ.

3. අධ්‍යක්ෂ මණ්ඩලයට සාමාජිකයන් 12 කි. එයින් 08 ක් කලාපයෙන් ද , ඉතිරි 04 දෙනා කලාපයෙන් පිට සාමාජිකයන්ගෙන් ද පත් වේ. නිල කාලය අවුරුදු 02 කි. අවශ්‍යතාව අනුව රැස් වේ.

4. සභාපතිවරයා අධිපති මණ්ඩලය විසින් පත් කෙරේ. අධිපති මණ්ඩලයට හෝ අධ්‍යක්ෂ මණ්ඩලයට අයත් නොවන පුද්ගලයෙකු මේ සඳහා පත්කරනු ලැබුව ද නිල බලයෙන් එම ආයතන දෙකේම සාමාජිකත්වය ද අධ්‍යක්ෂ මණ්ඩල සහභාගීත්වය ද හිමි වේ. නිල කාලය වසර 05 කි.

■ <u>ආසියානු සංවර්ධන බැංකුව හා ශ්‍රී ලංකාව.</u>

ශ්‍රී ලංකාව ද මෙහි සාමාජිකයෙකි.

ශ්‍රී ලංකාවට සපයා ඇති ආධාර අතුරින් කිහිපයක්,

1. බෝවතැන්න ජල විදුලි බලාගාරය.
2. සපුගස්කන්ද යූරියා පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය.
3. ශ්‍රී ලංකාවේ බටහිර වෙරළබඩ ධීවර කර්මාන්ත සංවර්ධනය.
4. කිරිඳි ඔය සංවර්ධන ව්‍යාපෘතිය.
5. සෙවනගල සහ ගල්ඔය සීනි කර්මාන්ත සංවර්ධනය.
6. ධීවර වරාය සංවර්ධනය.
7. බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය.
8. සුනාමියෙන් අවතැන් වූවන් නැවත පදිංචිය සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 157 ක් ලබා දීම.
9. උතුරු නැගෙනහිර ජනතාව නැවත නඟා සිටුවීමේ සහ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (North - East Community Restoration and Development Project) යටතේ ඔවුන් නැවත පදිංචි කිරීමට සහ ඔවුන්ගේ මූලික අවශ්‍යතා සපුරාලීමට උදවු කිරීම.

## රාජ්‍ය නොවන සංවිධාන

■ <u>රාජ්‍යය නොවන සංවිධාන වල ආරම්භය, වර්ධනය සහ විකාශය.</u>

රාජ්‍ය නොවන සංවිධාන (Non Government Organization) යනු පරවැසියන් හෝ පුරවැසි කණ්ඩායම් හෝ එම දෙඅංශයම හෝ අන්තර්ජාතික මට්ටමින් සහයෝගීතාවක් ගොඩනගා ගැනීමේ අරමුණින් ස්ථාපිත කරගනු ලැබූ සංවිධාන විශේෂයකි. මේවා ආණ්ඩු මගින් මෙහෙයවන, ස්ථාපිත කරන ලද හෝ කවර ආකාරයක හෝ ප්‍රතිපාදන සපයන හෝ ආයතන වර්ගයක් නොවේ. 1968 දී එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ මණ්ඩල මගින් සම්මත කළ යෝජනාවකට අනුව අන්තර් රාජ්‍ය ගිවිසුමක් යටතේ නොපිහිටවූ ඕනෑම ජාත්‍යන්තර සංවිධානයක් රාජ්‍යය නොවන සංවිධානයක් ලෙස හැඳින්විය යුතු ය.

මේවා දේශපාලන කාර්යන්ගෙන් මිදුනු ඒවා වන අතරම, දේශපාලන බලය අපේක්ෂා කරන පක්ෂ හෝ කණ්ඩායම් ද නොවේ. එහෙත් තම අරමුණු නඟා සිටුවීමට රාජ්‍ය බලයේ ආරක්ෂාව අපේක්ෂා කරයි.

රාජ්‍ය නොවන සංවිධාන වල පරමාර්ථය වන්නේ සමස්ත සමාජයමේ හෝ ඉන් කොටසක හෝ සමාජ ආර්ථික සංවර්ධන නගා සිටුවීම වේ.

එම නිසා මෙම සංවිධාන වෘත්තීය සමිතිවල ස්වරූපයෙන් වෙනස් වූ ලාභාංශ කෙරහි නැඹුරුවක් නැති සංවිධාන විශේෂයකි. එහෙත් රාජ්‍යය නොවන සංවිධාන ඒ ඒ රාජ්‍යයන්හි තිරසාර සංවර්ධනයක් අරමුණු කරගනු ලැබූ සහ රම අරමුණු සාධනය සඳහා උපයෝගීකර ගත හැකි ද යන්න නූතනයේ දී පිගැනීමකට ලක් වූ මතයකි.

## අන්තර්ජාතික රතු කුරුස සමාජය.
## International Committee Of Red Cross - ICRC

ආරම්භය.

1864 ඇතිකර ගත් ජිනීවා සම්මුතිය මඟින් බිහිකර ගන්නා ලදි. මෙහි නිර්මාතෘවරයා ඉතාලි ජාතික හෙන්රි ඩුනාන්ට් වේ. 1859 උතුරු ඉතාලියේ සිදු වූ සටනින් තුවාල ලද සෙබළුන් පත් දුක්ඛිත තත්ත්වය දුටු මොහු එබඳු අයට උදවු කිරීම සඳහා තවත් පුද්ගලයන් 04 දෙනෙකු සමඟ එක්ව පිවිටුවා ගන්නා ලද අතර 1684 ජිනීවා සම්මේලනයේ දී එය නිළ වශයෙන් පිහිටුවා ගන්නා ලදි.

අරමුණු

1. මනුෂ්‍ය වර්ගයාට කවර ස්ථානයකදී වුවද විඳින්නට සිදුවන වේදනා වැළැක්වීමට සහ අඩු කිරීමට ප්‍රයත්න දැරීම.

2. මනුෂ්‍ය වර්ගයාගේ ගෞරවය රැකෙන පරිදි ක්‍රියාකිරීම.

3. ජාතිය, ආගම, පන්තිය නොසලකා පුද්ගල අවශ්‍යතා ඉටුකර දීමට කටයුතු කිරීම.

4. සියලු දෙනාගේම විශ්වාසය ලැබෙන පරිදි වාද විවාද වලින් තොරව අපක්ෂපාතී ලෙස ක්‍රියා කිරීම.

5. ඒ ඒ රාජ්‍යයන්හි නීති රීති වලට යටත්ව රතු කුරුස සංවිධානයේ ප්‍රතිපත්තිවලට අනුකූලව ක්‍රියා කිරීම.

6. ලාභාපේක්ෂාවෙන් තොරව ස්වේච්ඡාවෙන් සහන සැලසීම.

7. එක් රටක එක් රතු කුරස සමාජයක් පමණක් පිහිටුවීම.

8. රතුරු කුරුස සමාජය රටේ සියළු දෙනාටම විවෘත වන අතර දේශ සීමාව තුළ මනුෂ්‍ය වර්ගයාගේ යහපත සඳහා ක්‍රියා කිරීම.

**<u>සාමාජිකත්වය.</u>**

1863 පිහිටුවාගත් අන්තර්ජාතික රතුකරුස සමාජය ස්විස් ජාතික සාමාජිකයින් 25 ගෙන් සමන්විත වේ. ඕනෑම රටකට රතු කුරුස සමාජපිහිටුවා ගත හැකි අතර එසේ පිහිටුනා ගන්නා ලද රතු කුරුස සමාජයක රටේ ඕනෑම පුරවැසියෙකුට සාමාජිකත්වය ගත හැකිය. එම සාමාජිකයින් සංවිධානයේ නීතියට මෙන්ම අදාළ රාජ්‍යයේ නීතියට යටත්විය යුතු ය. දැනට සාමාජිකත්වය දශ ලක්ෂ 300 කට අධික වන අතර රටවල් 146 ක රතු කුරුස සමාජ පිහිටුවා ඇත.

**<u>සංවිධාන යාන්ත්‍රණය.</u>**

වැදගත් ආයතන 03 ක් පවතී.

I. අන්තර්ජාතික රතු කුරුස සම්මේලනය.
II. අන්තර්ජාතික රතු කුරුස කමිටුව.
III. ජාතික රතු කුරුස සමාජ.

• අන්තර්ජාතික රතු කුරුස සම්මේලනය.

1919 ආරම්භ කරන ලදි. වසර 04 කට වරක් පැවැත්වේ. මෙහි කාර්යයන් වන්නේ ජාතික රතු කුරුස සමාජ පිහිටුවා ඒවා අතර අන්‍යෝන්‍ය සබඳතා පවත්වා ගැනමට උපකාර කිරීම හා ජාතික සමාජවලට උපදෙස් දීම සහ අධාර දීම.

• අන්තර්ජාතික රතු කුරුස කමිටුව.

1863 පිහිටුවන ලද මෙය ස්විස් ජාතික සාමාජිකයින් 25 ගෙන් සමන්විත වේ. ආධාර සපයන්නේ ස්විස්ටර්ලන්ත රජය සහ ඒ ඒ රටවල ජාතික මට්ටමේ රතු කුරුස සමාජ මගිනි. කාර්යයන් වන්නේ සංවිධානයේ මූලික ප්‍රතිපත්ති පවත්වාගෙන යාම, සේවාවන් ව්‍යාප්ත කිරීම, අලුතින් පිහිටුවන රතු කුරුස සමාජ පිළිගැනීම යනාදියයි.

• ජාතික රතු කුරුස සමාජ.

එක් එක් රටවල පිහිටුවන රතු කුරුස සමාජ මෙයින් අදහස් කෙරේ. රටක ඕනෑම පුරවැසියෙකුට මෙහි සාමාජිකත්වය ගත හැක.

## ■ <u>ශ්‍රී ලංකාව සහ රතුකුරුස සංවිධානය.</u>

ආරම්භය.

ආරම්භය වන්නේ බ්‍රිතාන්‍යය රතු කුරුස සමාජයේ ශාඛාවක් වශයෙනි. ඒ 1936 වසරේදී ය. 1949 දී මෙය 'ලංකා රතු කුරුස සමාජය' බවට පත් වූ අතර 1952 දී මෙය අන්තර්ජාතික රතු කුරුස කිමිටුව විසින් පිළිගන්නා ලදි. 1972 දී මෙය 'ශ්‍රී ලංකා රතු කුරුස සමාජය' බවට පත් විය. ඕනෑම පුරවැසියෙකුට සාමාජිකත්වය ගත හැකි අතර ඒ සියල්ලගේ එකතුවෙන් පිහිටුවා ගන්නා ලද මහා සංගමය මගින් සියලු තිරණ ගැනේ. ප්‍රධාන කාර්යාලය කොළඹ පවතින අතර මහනුවර සහ කුරුණෑගල ශාඛා දෙකක් පවතී.

ශ්‍රී ලංකාවේ රතු කුරුස සමාජය විසින් පහත සඳහන් සේවා ඉටු කෙරේ.

1. ප්‍රථමාධාර පුහුණුව සහ සේවාව.
2. ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණය.
3. ගෘහ සාත්තු සේවය.
4. ගිලන් රථ සේවා.
5. ලේ දන් දෙන්නවුන් බඳවා ගැනීම.
6. විපතට පත් පුද්ගලයන් පිළිබඳ සොයා බැලීම සහ තොරතුරු සැපයීම.
7. තරුණ සේවා කටයුතු
8. පෝෂණ සේවා.
9. ප්‍රජා සංවර්ධන වැඩසටහන්.

පසුගිය කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල පැවති සිවිල් යුද්ධ පරිසරය තුළ රතු කුරුසය විශාල කාර්ය භාරයක් ඉටු කරන ලදි. විශේෂයෙන් LTTE සංවිධානයට යටත්ව තිබූ ප්‍රදේශවල සාමාන්‍ය ජනතාවගේ සෞඛ්‍යය පහසුකම්, විපතට පත් පුද්ගලයින්ගේ අවශ්‍යතා සොයා බැලීම සහ විශේෂයෙන් එම ප්‍රදේශ සහ රජය අතර සම්බන්ධතා පවත්වා ගැනීම ඇතුලු සේවා රැසක් ඉටු කරන ලදි.

## ජාත්‍යන්තර ක්‍ෂමා ආයතනය
## Amnesty International

ආරම්භය.

1961 එංගලන්තයේ පීටර් බෙන්සන් (Peter Beneson) සහ එරික් බේකර් (Eric Baker) විසින් ආරම්භ කළ Apeal For Amnesty උද්ඝෝෂණය පදනම් කර ගනිමින් 1962 සැප්තැම්බර් 30 දින ජාත්‍යන්තර ක්‍ෂමා ආයතනය (Amnesty International) පිහිටුවන ලදි.

අරමුණු.

මානව හිමිකම් කඩවීම් වලට ලක් වූ පුද්ගලයන්ට සාධාරණත්වය ලබා දීම, මානව අයිතිවාසිකම් දූෂණයට ලක් කිරීම අවසන් කිරීම සඳහා මාධ්‍ය අවධානය යොමු කිරීම, සෘජු අභියාචනා ඉදිරිපත් කිරීම සහ ඒ පිළිබඳ සමීක්‍ෂණය කිරීම මෙහි ආරම්භක අරමුණ වුව ද අදවන විට සරණාගතයන්, පීඩනයට පත් කුල, ආගම් සහ ජනවර්ගවලත්, කාන්තාවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටියි. මේ අනුව ජාත්‍යන්තර ක්‍ෂමා ආයතනය පහත සඳහන් ක්ෂේත්‍රයන්හි ක්‍රියාත්මක වේ.

1. කාන්තා අයිතිවාසිකම්
2. ළමා අයිතිවාසිකම්
3. හිංසනය නිමාකිරීම.
4. මරණ දඬුවම අහෝසි කිරීම.
5. සරණාගතයින්ගේ අයිතිවාසිකම්
6. හිරකරුවන්ගේ අයිතිවාසිකම්
7. මානව ගරුත්වය ආරක්‍ෂා කිරීම.

සාමාජිකත්වය.

කැමති පුද්ගලයෙකුට මෙහි සාමාජිකත්වය ගත හැක. ඒ අනුව ස්වේච්ඡාත්මක පදනම මත සම්බන්ධ වූ සාමාජිකයින් විශාල ප්‍රමාණයක් සහ වැටුප් වෘත්තීයවේදීන් කිහිපදෙනෙකුගෙන් මෙය සමන්විත වේ. වර්තමානය වන විට සාමාජිකයින් සහ දක්වන්නන් මිලියන 2.2 කට ආසන්න ප්‍රමාණයක් සිටී.

සංවිධාන යාන්ත්‍රණය.

1. එක් එක් රටවල සාමාජිකයින් පිහිටුවා ගන්නා 'ඒකක' (Section) පහළම ආයතනය බවට පත් වේ. කුඩා සාමාජිකයින් ප්‍රමාණයක් සිටින රටවල පවත්නා එබඳු සංවිධාන 'ව්‍යූහ' (Structure) නමින් හැඳින්වේ.

2. මෙබඳු 'ඒකක' (Section) සහ 'ව්‍යූහ' (Structure) යන සංවිධාන නොමැතිරටවල පුද්ගලයින්ට ද ජාත්‍යන්තර ක්‍ෂමා ආයතනයේ 'ජාත්‍යන්තර සාමාජිකයින්' (International Member) විය හැකිය.

3. මෙම ආයතනවල කාර්ය වන්නේ මූලික ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම වේ.

4. මෙම 'ඒකක' (Section) සහ 'ව්‍යූහ' (Structure) සංවිධානවල සාමාජිකයින්ට ඒවායේ සාමාජික ප්‍රමාණයට අනුව නියෝජිතයන් පිරිසක් පත් කළ හැකි අතර, එම නියොජිතයන්ගෙන් සමන්විත 'අන්තර්ජාතික කවුන්සිලය' (International Council) සංවිධාන යාන්ත්‍රණයේ මීලඟ ආයතනය වේ.

5. මෙම අන්තර්ජාතික කවුන්සිලය (International Council) තුළ සියලු සාමාජිකයින් ජාත්‍යන්තර පද්ධති, මෙම ඒකක (Section) සහ ව්‍යූහ (Structure) නියෝජනය වුවද ඡනදය දීමේ අයිතිය ඒකක (Section) සහ ව්‍යූහ (Structire) වලට පමණක් හිමි වේ.

6. අන්තර්ජාතික කවුන්සිලය අවුරුදු 02 කට වරක් රැස්වේ.

7. මෙම අන්තර්ජාතික කවුන්සිලයෙන් පත්කර ගන්නා සාමාජිකයින් 08 ගෙන් හා (International Executive Committee) ජාත්‍යන්තර ක්ෂමා ආයතනයේ ඉහළම ආයතනය වේ.

8. ජාත්‍යන්තර ක්ෂමා සංවිධානයේ දෛනික කටයුතු ඉටුකිරීමේ වගකීම දරණ අන්තර්ජාතික කවුන්සිලය සහ අන්තර්ජාතික විධායක කොමිටිය විසින් මෙහෙයවන 'අන්තර්ජාතික ලේකම් කාර්යාලයක්' (International Secretariat) සහ ලේකම්වරයෙක් ද සිටී.

9. 2005 වන විට 'ඒකක' (Section) 52 ක් සහ 'ව්‍යූහ' (Structure) 23 ක් ද පැවතුණි.

- <u>ශ්‍රී ලංකාව සහ ජාත්‍යන්තර ක්ෂමා ආයතනය.</u>

ජාත්‍යන්තර ක්ෂමා දංවිධානය තම අරමුණු මුදුන් පමුණුවාගැනීම සඳහා යොදාගන්නා ප්‍රබලතම මධ්‍ය අදාළ අයිතිවාසිකම් කඩවීම පිළිබඳ මහජන මතයක් ගොඩනැගීම වන අතර ඒ සඳහා උපාය මාර්ග භාවිතයට ගනී. ප්‍රවෘත්ති සාකච්ඡා (Press Release) ඒ අතරින් එක් උපායක් වන අතර 2005 වන විට එබඳු ප්‍රවෘත්ති සාකච්ඡා 52 ක් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් පවත්වා ඇත.

## මානව හිමිකම් විමර්ශන සංවිධානය
## Human Rights Watch

<u>ආරම්භය.</u>

1975 හෙල්සින්කි සම්මුතිය මත හෙල්සින්කි විමර්ශන (Helcinki Watch) සංවිධානයේ ආරම්භයක් සමඟ 1978 ආරම්භ විය.

1981 ඇමෙරිකන් විමර්ශන (American Watch) සංවිධානයත්, 1985 ආසියා විමර්ශන (Asia Watch) සංවිධානයත් , 1988 අප්‍රිකා විමර්ශන (Africa Watch) සංවිධානයත් , 1898 මැද පෙරදිග විමර්ශන (Middle east Watch) සංවිධානයත් ආරම්භ වූ අතර 1988 මේ සියල්ල එක්ව මානව හිමිකම් විමර්ශන සංවිධානය (Human Rights Watch) පිහිටුවා ගත් හ.

<u>ප්‍රතිපත්ති.</u>

1. ලෝ වටා සිටින ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට කැපවී ක්‍රියාකිරීම.

2. අසමාන සැලකිලි නැති කිරීමට, දේශපාලන නිදහස ආරක්ෂාකර ගැනීමට , යුධ කාලවල දී සිදුවන අමානුෂික සැලකිලිවලින් ජනතාව ආරක්ෂා කර ගැනීමට සහ වරදකරුවන් නීතිය ඉදරියට ගෙන යාමට පීඩාවට පත් වූවන් සමඟ නැගී සිටීම.

3. මානව අයිතිවාසිකම් කඩවීම සහ ඒවාට වගකිව යුතු දූෂිතයන් හසුකර ගැනීමට අවශ්‍ය විමර්ශනයන් සහ හෙළිදරව් කිරීම සිදු කිරීම.

4. ලොව සෑම රාජ්‍යයකටම සහ බලය අත්පත්කරගෙන සිටින්නන්ට බලය අයුතු ලෙස භාවිතය අවසන් කිරීමට සහ අන්තර්ජාතික මානව හිමිකම් නීතියට ගරු කිරීමට බල කිරීම.

<u>ක්‍රියාකාරීත්වය.</u>

1975 සිට මේ දක්වා ඉහත අරමුණු සාධනය කිරීම සඳහා පුළුල් වැඩකොටසක් ඉටුකරන ලද අතර 1977 දී ඔවුන් ගෙනයන ලද බිම් බෝම්බ තහනම් කිරීමේ අන්තර්ජාතික උද්ඝෝෂණය සඳහා නොබෙල් සාම ත්‍යාග (Nobel Peace Prize) හිමිකර ගන්නා ලදි.